පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 290

ආයතනයේ නම - ඉඩම් අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු ආයතන හාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற அமர்வு இலக்கம் – 290

நிறுவனத்தின் பெயர் - காணிஅமைச்சு

பொதுக் கணக்குகளுக்கான பாராளுமன்றத்தின் குழுவினால் பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பில் நிலையியற் கட்டளை இல. 119 (4) இன் கீழ் நிறுவனத்துக்குப் பொறுப்பு வகிக்கும் கௌரவ அமைச்சரினால் மேற்கொள்ளப்பட்ட அவதானங்கள் மற்றும் நடவடிக்கைகள் ஆகியவற்றைச் சமர்ப்பித்தல்.

Parliament Session Number – 290

Name of the Institute - Ministry of Lands

Submission of the observations and steps taken by the Hon. Minister in charge of the institute under the standing order No 119(4) related to the reports tabled into the parliament by the Committee of Public Accounts (COPA) to the parliament.

ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව රජයේ ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගන්නා ලද ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු සැසි අංක - 290

ආයතනයේ නම - ඉඩම් අමාත්‍යාංශය

	කමිටුව විසින් හඳුනා ගන්නා ලද දුර්වලතා අඩුපාඩු	නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්වය
01	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මාසයක් තුල පිළිතුරු නොසැපයීම.	අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී මාසය ඉක්මවූ විගණන විමසුම් සම්බන්ධයෙන් සාකච්ඡා කර පිළිතුරු ලබා දීමට නියෝග ලබා දේ.
02	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් ආනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.
03	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබීම.	වාහන අනතුරු සම්බන්ධයෙන් සිදුවන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා ප්‍රායෝගිකව අනුගමනය කළයුතු ක්‍රමවේදයක් හඳුනාගෙන ඒ පිළිබඳව නිලධාරින් සහ රියදුරන් දැනුවත් කර ඇත. මේ සඳහා විශේෂ පුහුණු වැඩසටහන් රියදුරන් ඉලක්ක කර 2021 සහ 2023 වර්ෂවල පවත්වා ඇති අතර Skills Development Fund LTD ආයතනය මඟින් පැවැත්වූ ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ මාර්ගගත පුහුණු වැඩසටහනට ප්‍රවාහන නිලධාරි සහභාගි කරවා ඇත. 2021 වර්ෂය වන විට වාහන අනතුරු සම්බන්ධයෙන් අවසන් නොකල මු.රෙ. පරීක්ෂණ

		14ක් පමණ තිබූ අතර මේ වන විට ඉන් 11ක් අවසන් කර ඇත. Covid 19 වසංගත තත්වය පැවති කාලය තුල පැවති ප්‍රායෝගික හේතූන් නිසා මු.රෙ. පරීක්ෂණ සිදු කිරීමට ප්‍රමාද විය. ආමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත අනුයුක්ත වාහන අනතුරු සම්බන්ධයෙන් පැවති අඩුපාඩු (පොලිස් වාර්තා ලබා ගැනීමට ප්‍රමාද වීම් වැනි) නිවැරදි කරගනිමින් ඉතිරි අනතුරු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරමින් සිටි.තවද වර්තමානය වන විට අමාත්‍ය කාර්ය මණ්ඩලය සඳහා ඒකාබද්ධ සේවයේ රියදුරන් වැඩි වශයෙන් සේවයේ යොදවා ඇති බවද දන්වමි.
04	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනයවීම පිළිබඳව පරීක්ෂා කර නොතිබීම.	ඉන්ධන පරීක්ෂාවන් සඳහා 2021 වර්ෂයේදී කමිටුවක් පත් කළ නමුත් 2020 හා 2021 කාලය තුල ක්‍රියාත්මක වූ Covid 19 වසංගත තත්වය හේතුවෙන් රාජකාරී කටයුතු අඛණ්ඩව කරගෙන යාමට බාධාවක් පැමිණි අතර ඉන්ධන පරීක්ෂාවන් සිදු කිරීමට ප්‍රායෝගික වශයෙන් බාධා ඇතිවිය. තවද පසුව පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් අමාත්‍යාංශයේ වාහන භාවිතය අවම කරමින් රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීමට කටයුතු කරන ලද අතර 2023 වර්ෂයේ ක්‍රියාතමක වූ ජාතික ඉන්ධන කෝටා බලපත්‍රය මත ඉන්ධන නිකුත් කිරීම නිසා ඉන්ධන පරීක්ෂා කිරීමේ ප්‍රයෝගික හා ඵලදායිතා ගැටළු මතු විය. නමුත් 2024 වර්ෂයේදී සුදුසු පරිදි ඉන්ධන පරීක්ෂාවන් සිදු කිරීමට කටයුතු යොදා ඇත.

05	පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර නොතිබුණි.	2021.12.29 දින වන විට පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි සකස් කර අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කර ඇත. මීහිකත මැදුර ගොඩනැගිල්ල තුල අමාත්‍යාංශයට අමතරව තවත් දෙපාර්තමේන්තු දෙකක් ද පවතින බැවින් පුරවැසි ප්‍රඥප්තිය ප්‍රදර්ශනය කරන්නේ කුමන ස්ථානයේද යන්න පිළිබඳ පැවති ගැටළුව මත හා පැවති ප්‍රතිපාදන තත්වය මතද, අනතුරුව අමාත්‍යාංශයේ විෂය පථය සංචාරක හා ඉඩම් ලෙස සංශෝධනය වූ බැවින් ඉහත ඉඩම් අමාත්‍යාංශයට අදාලව සැකසූ පුරවැසි ප්‍රඥප්තිය භෞතිකව ප්‍රදර්ශනය කිරීමට කටයුතු නොකරන ලදී. මේ වන විට පුරවැසි ප්‍රඥප්තිය භෞතිකව ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවති.
06	ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබීම.	මේ වන විට අධීක්ෂණය සහ ඇගයීම් කටයුතු සිදු කිරීමේ වගකීම සියළුම අංශ ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන් වෙත පවරා ඇත.
07	සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	2022 සහ 2023 වර්ෂයට අදාලව සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව ඇත.

හරින් ප්‍රනාන්දු (හා.ම.)
සංචාරක හා ඉඩම් අමාත්‍ය

ස්ථාවර නියෝග අංක 119 (4) ප්‍රකාරව රජයේ ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගන්නා ලද ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාව - 290
ආයතනයේ නම - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව.

අනු අංකය	2021 වර්ෂය සඳහා අදාල කාර්ය සාධන ඇගයීම් ප්‍රකාරව හඳුනාගත් දුර්වලතා	දුර්වලතා සඳහා ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය
01	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබීම.	රටේ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් කාර්යාල කටයුතු සීමා කිරීම මත අන්තර් පළාත් කාර්යාල වලින් තොරතුරු ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් පිළිතුරු සකස් කිරීමට යම් කාලයක් ගත විය. ඉදිරියේදී මෙම අඩුපාඩු මහ හරවා සෑම විගණන විමසුමක් සඳහාම මසක් ඇතුලත පිළිතුරු සැපයීමට උත්සාහ කරන බව දැනුම් දෙමි.
02	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබීම.	රටේ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් කාර්යාල කටයුතු සීමා කිරීම මත අන්තර් පළාත් කාර්යාල වලින් තොරතුරු ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් පිළිතුරු සකස් කිරීමට යම් කාලයක් ගත විය. ඉදිරියේදී මෙම අඩුපාඩු මහ හරවා සෑම විගණන විමසුමක් සඳහාම මසක් ඇතුලත පිළිතුරු සැපයීමට උත්සාහ කරන බව දැනුම් දෙමි.
03	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උපවගන්තිය ප්‍රකාර 2018.08.01 දිනෙන් පසුව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබීම.	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේනතුවට අදාලව සිදු කරනු ලබන අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් 2019,2020,2021,2022 සහ 2023 වර්ෂයන් වල ඊමේල් මගින් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
04	වාහනයක් ගර්හිත වී මාස 08 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම.	දෙපාර්තමේන්තුව සතු ධාවනය කළ නොහැකි තත්ත්වයේ වාහන අපහරණය සම්බන්ධව තීරණය ගැනීම සඳහා පත් කරන ලද කමිටු නිර්දේශය 2022.09.30 දිනැතිව ලබාදී තිබූ අතර, එමඟින් අපහරණයට සුදුසු වාහන 06 ක් හඳුනාගෙන තිබුනි. ඒ අනුව 54-4013 සහ 54-4012 MITSUBISHI කැබ් රථ දෙක අලුත්වැඩියා කර මේ වන විට ධාවන තත්ත්වයට පත් කර දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 02 ක් වෙත ලබාදීමට කටයුතු කර ඇත. එසේම 32-1187 හා 32-3295 MITSUBISHIPEJERO රථ දෙක අලුත්වැඩියාව සඳහා විශාල පිරිවැයක් දැරිය යුතු බැවින් 2023.11.09 දින කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ

		මණ්ඩලය වෙත පවරා දීමට කටයුතු කර ඇත. KH-5690 සහ KH-5694MICRO KRON රථ දෙක අපහරණය කිරීමේ කටයුතු මේ වන විට සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය මගින් සිදු කරමින් පවතී.
05	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබීම.	2023.12.31 දින වන විට දෙපාර්තමේන්තුවේ වාහන වලට අදාල NA 9290 ගොනුවව හැර ඉතිරි අනතුරු ගොනු සම්බන්ධයෙන් මු.රෙ. 103, 104,109 හා 110 ප්‍රකාරව කටයුතු කර අවසන් කර ඇත. NA 9290 වාහනයට අදාලව රියදුරුට විණයානුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබාදෙන ලද උපදෙස් වලට අනුව කමිටුවක් පත් කර අදාල පරීක්ෂණ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. ඉහත පරීක්ෂණයෙන් අනතුරුව දෙපාර්තමේන්තුව මගින් දරණු ලැබූ පිරිවැය මු.රෙ. 109 ප්‍රකාරව පොත් වලින් ඉවත් කිරීමේ කටයුතු සිදු කල හැක.
06	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහන වල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබීම.	රටේ පවතින වර්තමාන තත්ත්වය තුල රාජ්‍ය වියදම් කළමණාකරනය වෙනුවෙන් ගෙන තිබෙන ප්‍රතිපත්තිමය තීරණ හේතුවෙන් ඉන්ධන සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය සීමා සහිත වීමත් පසුගිය කාල වකවානුව තුළ වාහන සඳහා කෝටා පදනම මත ඉන්ධන නිකුත් කිරීමත් යන කරුණු මත ලබාදී ඇති ක්‍රමවේදය ඔස්සේ ඉන්ධන සඳහා පරීක්ෂාව සිදු කිරීමේ ගැටළු සහගත තත්ත්වයක් ඇති බව නිරීක්ෂණය විය. එබැවින් වර්තමාන තත්ත්වයට ගැලපෙන වඩාත් පහසු හා පිරිමැසුම් දායක ක්‍රමවේදයක් තුල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් මගේ අංක LCGD/AD/15/81 හා 2023.04.20 දිනැති ලිපියෙන් ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙතින් උපදෙස් ඉල්ලා ඇති අතර, ඔහු විසින් ලබාදෙනු ලබන උපදෙස් වලටඅනුව ඉදිරි කටයුතු කිරීමට නියමිතය.
07	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබීම.	ගැලපුම් කළ යුතුව තිබූ සියලු ශේෂ නිරවුල් කර ඇත.
08	මු.රෙ. 94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු ඉතිරි වූ ප්‍රතිපාදන අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබීම.	අදාල වර්ෂයේ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු ඉතිරි වූ ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළඹී නැත.
09	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571	2021/05/04 දිනැති අමප/21/0613/322/006 අංක දරණ අමාත්‍ය මණ්ඩල තීරණ යටතේ මිහිකත මැදුර සිව්වන මහළ

	ප්‍රකාරව කටයුතු කර නොතිබීම.	ඉදිකිරීම් සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳව මධ්‍ය උපදේශක කාර්යාංශය වෙත නොගෙවා රඳවා තබා ගැනීමට අනුමැතිය ලැබී ඇත. දැනට මෙම මහලේ ඉදිකිරීම් කටයුතු කරගෙන යන බැවින් කොටස් වශයෙන් තැන්පතු මුදල් නිරවුල් කරමින් පවතී.
10	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මසක් ඇතුලත නිරවුල් කර නොතිබීම.	නිලධාරීන් ලිඛිතව දැනුවත් කිරීම නිසා මෙම දුර්වලතාවය වර්තමානයේදී ඉතා අවම මට්ටමක පවත්වා ගත හැකි විය. ඉදිරියේදී ද පසුවිපරම් කටයුතු සිදු කරමින් මෙම තත් කාර්යය අතුරු අග්‍රිමය කාර්ය නිමකල වහාම නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි.
11	අනුමත අග්‍රිම ගිණුම් ශේෂ භාණ්ඩාගාරයේ පොත් සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක් මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබීම.	කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක් මුදල් සැසඳුම් ප්‍රකාශ නියමිත පරිදි භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
12	රැස්කර කිබුණු ආදායම් සෘජුවම ආදායමට බැර කර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන මාසයට වඩා අඩු කාලයක් ඇතුලත ආදායම් ගිණුමට බැර කර හෝ නොතිබීම.	සියලුම ආදායම් රැස්කරන ලද මාසය තුලදීම පොදු තැන්පත් ගිණුමේ රඳවා ගැනීමකින් තොරව අදාල ආදායම් ශීර්ෂයට බැර කර ඇත.
13	කාර්ය මණ්ඩලයේ සියලු දෙනා වෙත ලිඛිත කාර්ය පැවරුම් කර නොතිබීම.	2024 වර්ෂය සඳහා කාර්ය මණ්ඩලය වෙත ලිඛිත පැවරුම් කිරීමට කටයුතු කර ඇත.
14	පුරවැසි/ සේවාලාභී ප්‍රඥාප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබීම.	මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය සහ අන්තර් පළාත් කාර්යාල 06 කින් සහ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල 02 කින් සමන්විත රජයේ ඉඩම් කළමණාකරණය වෙනුවෙන් සුවිශේෂී වූ කාර්ය භාරයක් ඉටු කරන ආයතනයකි. එහිදී දෙපාර්තමේන්තු කාර්ය භාරය ඉටු කිරීම සඳහා වෙනත් රාජ්‍ය ආයතන හා දෙපාර්තමේන්තු මගින් විවිධ නිර්දේශ හා විවිධ තොරතුරු ලබා ගැනීමට සිදු වේ. මෙවැනි අවස්ථා වලදී එකම කාර්යයකට වුවද යොමු වන ලිපිවල තිබිය යුතු තොරතුරු නිවැරදිව සම්පූර්ණ නොවීම හේතුවෙන් නැවතත් ගෙන්වා ගැනීමට සිදු වීම නිසා අපේක්ෂිත කාලයට වඩා අමතර කාලයක් වැය වන අතර, වැය වන කාලයද නිශ්චිතව සඳහන් කිරීමේ හැකියාවක් නැත. මෙවන් පසුබිමක් තුල මෙම දෙපාර්තමේන්තුවේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ප්‍රදර්ශනය කිරීම හේතුවෙන් එකම කාර්යය සිදුකර ගැනීමට පැමිණෙන සේවා ලාභීන් දෙදෙනෙකු හට එකම කාලසීමාවක් තුල එම අවශ්‍යතාවය

		ඉටුකර ගැනීමට නොහැකි වේ. එබැවින් එක් එක් වැඩ පියවරයන්ට අදාලව නිශ්චිත කාල රාමුවක් ලබාදීමේ හැකියාවක් නොපවතින බැවින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ප්‍රදර්ශනය කිරීම තුලින් ගැටළුකාරී තත්ත්වයක් මතුවන බැවින් ඒ සම්බන්ධයෙන් අංක LCGD/AD15/50 හා 2023.11.27 දිනැති ලිපිය මගින් විගණකාධිපතිවරයා දැනුවත් කිරීමට පියවර ගෙන ඇත.
15	ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබීම.	මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය සහ අන්තර් පළාත් කාර්යාල 06 කින් සහ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල 02 කින් සමන්විත රජයේ ඉඩම් කළමණාකරණය වෙනුවෙන් සුවිශේෂී වූ කාර්ය භාරයක් ඉටු කරන ආයතනයකි. එහිදී දෙපාර්තමේන්තු කාර්ය භාරය ඉටු කිරීම සඳහා වෙනත් රාජ්‍ය ආයතන හා දෙපාර්තමේන්තු මගින් විවිධ නිර්දේශ හා විවිධ තොරතුරු ලබා ගැනීමට සිදු වේ. මෙවැනි අවස්ථා වලදී එකම කාර්යයකට වුවද යොමු වන ලිපිවල තිබිය යුතු තොරතුරු නිවැරදිව සම්පූර්ණ නොවීම හේතුවෙන් නැවතත් ගෙන්වා ගැනීමට සිදු වීම නිසා අපේක්ෂිත කාලයට වඩා අමතර කාලයක් වැය වන අතර, වැය වන කාලයද නිශ්චිතව සඳහන් කිරීමේ හැකියාවක් නැත. මෙවන් පසුබිමක් තුල මෙම දෙපාර්තමේන්තුවේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ප්‍රදර්ශනය කිරීම හේතුවෙන් එකම කාර්යය සිදුකර ගැනීමට පැමිණෙන සේවා ලාභීන් දෙදෙනෙකු හට එකම කාලසීමාවක් තුල එම අවශ්‍යතාවය ඉටුකර ගැනීමට නොහැකි වේ. එබැවින් එක් එක් වැඩ පියවරයන්ට අදාලව නිශ්චිත කාල රාමුවක් ලබාදීමේ හැකියාවක් නොපවතින බැවින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ප්‍රදර්ශනය කිරීම තුලින් ගැටළුකාරී තත්ත්වයක් මතුවන බැවින් ඒ සම්බන්ධයෙන් අංක LCGD/AD15/50 හා 2023.11.27 දිනැති ලිපිය මගින් විගණකාධිපතිවරයා දැනුවත් කිරීමට පියවර ගෙන ඇත.
16	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම.	2023 දෙසැම්බර් 31 වන විට 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සැළැස්ම පිළියෙල කර අවසන් කර ඇත.
17	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් 50% වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබීම.	රාජ්‍ය වියදම් කළමණාකරන ප්‍රඥප්තිය තුල 2023 වසරේ පුහුණු වැඩසටහන් සඳහා මිළියන 5 ක වියදම් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුනද දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන ලද්දේ ඉතාම සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයක් පමණි. එබැවින් පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම ගැටළු සහගත විය.

18	මානව සම්පත් සංවර්ධන සැළසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුනතා සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබීම.	මානව සම්පත් සංවර්ධන සැළසුම් සකස් කිරීමට ධාරිතා හා නිපුනතා සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට අංක LCGD/AD/7/01-03 (2021) හා 2021.03.15 දිනැති ලිපිය මගින් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කර ඇත.
19	සැළසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% කට වඩා අඩු මට්ටමක පැවතුණි.	රජයේ වියදම් කළමණාකරන ප්‍රතිපත්තිය තුල පුහුණු වැඩ සටහන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය ඉතා සීමිත විය. එබැවින් ලබාදෙන ලද ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් කිරීමට සිදු වූයේ සේවා ව්‍යවස්ථාවන්ට අනුව ජේෂ්ඨත්වය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන පුහුණු පාඨමාලා සඳහා පමණි. එබැවින් දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා ලබා දීමට තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය සීමා සහිත විය.
20	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අභිතකර මට්ටමේ විය.	2021 වර්ෂයට අදාල විගණන මතය තත්වාගණනය කළ මතයක් බව පෙන්වා දෙමි.
21	නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මූ.රෙ. 156 (1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබීම	මූ.රෙ. 156 (1) ප්‍රකාරව සියලු අයකිරීම් අවසන් කර ඇත.

හර්ෂ ප්‍රනාන්දු (පා.ම.)
සංචාරක හා ඉඩම් අමාත්‍ය

ආකෘති පත්‍රය (අංක **01**)

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය -290

ආයතනයේ නම - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

	කමිටුව හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු/වර්තමාන තත්වය නිවරදි කිරීමට ආයතනය ගෙන ඇති පියවර
01	විගණකාධිපතිගේ විගණන විමසුම් හා අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිලිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	ප්‍රමාද වූ විගණන විමසුම් සඳහා අදාළ අංශ ප්‍රධානීන් කැඳවා සාකච්ජා කර වහාම පිළිතුරු සකස් කර යැවීම මඟින් ප්‍රමාදයන් වැලැක්වීමට කටයුතු යොදා ඇත.
02	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාර 2018.08.01 දිනෙන් පසුව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් නළමණාකරන විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2020.10.07 දින හිටපු ප්‍රධාන අභ්‍යන්තර විගණක ස්ථාන මාරුවී ගොස් ඇති අතර 2021.10.12 දින වත්මන් ප්‍රධාන අභ්‍යන්තර විගණක සේවයට වාර්තා කර ඇත. එහෙත් ස්ථීර කාර්ය මණ්ඩලයක් ලබා දී තිබෙනුයේ 2021 දෙසැම්බර් මැද භාගයේ දී වන බැවින් එම කාලය තුල 2022 වර්ෂයට අදාල අවදානම් ලේඛනය හා විගණන සැලැස්ම සකස් කිරීමේ කටයුතු සිදු කර ඇත. වර්ථමානය වන විට විගණන විමසුම් වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යවනු ලැබේ.
03	මු.රෙ. 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අදාල කාල පරිච්ඡේදය තුල අභ්‍යන්තර විගණන නිලධාරියෙකු නොසිටි බැවින් විගණන විමසුම් වාර්තා නිකුත් කර නොමැත.
04	මු.රෙ. 134(2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අදාල කාල පරිච්ඡේදය තුල අභ්‍යන්තර විගණන නිලධාරියෙකු නොසිටි බැවින් විගණන විමසුම් වාර්තා නිකුත් කර නොමැත.
05	විගණන හා කළමණාකරන කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 2ක් වත් පවත්වා නොතිබුණි.	2021 වර්ෂය සඳහා පළමු රැස්වීම 2021.07.27 ද අවසන් රැස්වීම 2021.12.15 දිනද පවත්වා ඇත.
06	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදි ගත් වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට උක්ත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.
07	සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	අංක65-0745 දරණ වාහනය එක්සත් ජාතීනගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයට අයත් වාහනයකි. අයිතිය පවරා ගැනීමට මේ වන විට කටයුතු සිදු කරමින් පවතී.
08	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	සංචිත වාහන සියල්ලේම රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත.
09	වාහනයක් ගර්භිත වී මාස 8 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	53-0049 දරණ ඩබල් කැබ් රථය අපහරණ කටයුතු සිදු කිරීම සඳහා සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

10	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	මේ වන විට ලොග් සටහන් පොත් යාවත්කාලීන කර ඇත.
11	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.103,104,109,හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	PC-2375,PF-7866 දරණ වාහන සඳහා මු.රෙ.ප්‍රකාරව නිසි පරිදි කටයුතු කර ඇත.
12	2016.12.29 දිනැති අංක 2016 /30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිලිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	වාහන 18 ක ඉන්ධන පරීක්ෂාව මේ වන විට සිදු කර අවසන් කර ඇති අතර ඉතිරි වාහනවල ඉන්ධන පරීක්ෂාව මේ වන විට සිදු කෙරෙමින් පවති.
13	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව මසක් තුළ නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.
14	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	**මිය ගිය නිලධාරි, බී.එල්.එල්. ද සිල්වා මහතාගේ 19,546/=** ක ණය ශේෂය වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කල අතර 2022 සැප්තැම්බර් මස ණය ශේෂය සම්පූර්ණයෙන් අයකරගෙන අවසන් වී ඇත.**විශ්‍රාම ගිය නිලධාරී,එච්.කේ.සි.ඩයස් මහතාගේ රු.197,178/=** ක ණය ශේෂය 2022 අප්‍රේල් මස විශ්‍රාම පාරිතෝෂිකය මඟින් අයකරගෙන ඇත. වැඩ තහනම් වූ නිලධාරි, යූ.ජී.ජයවර්ධන මහතා **රු.93,730/=** 2016.12.30 දින සිට අනිවාර්ය නිවාඩු යවා 2017.03.22 දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි රාජකාරි වැඩ තහනම් කර ඇත. ඔහුට එරෙහිව පැවති විධිමත් විනය පරීක්ෂණයේ අවසන් වාර්තාව හා චෝදනා පත්‍රය ,නිලධාරියාට විරුද්ධව ගරු අධිකරණයේ විභාග වෙමින් පවතින අල්ලස් චෝදනාව සම්බන්ධයෙන් ලබා දෙනු ලබන අධිකරණ තීන්දුව අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට යටත්ව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත.විනය බලධරයා විසින් සුදුසු විනය ක්‍රියාමාර්ග දැනුම් දුන් පසු අදාළ ශේෂය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.
15	අනුමත අග්‍රිම ගිණුම් ශේෂ භාණ්ඩාගාරයේ පොත් සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂය සිට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
16	අක්මුදල් සැසඳුම් ප්‍රකාශය අනුව අනාවරණය වී තිබුණු වෙනස්කම් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.	2022 වර්ෂය සිට නිවැරදි කිරීමට පියවර ගෙන ඇත.

17	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	කාලයක සිටම පුරප්පාඩු සහිතව දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. Evaluation Form Marks 2021, ප්‍රශ්නාවලිය පිරවීමේදී Part 01,19 හි Sub KPI Level 1 හි 01 සඳහා වැරදීමකින් "නැත" යන්න සම්පූර්ණ කර තිබුණි. නමුත් සත්‍ය වශයෙන්ම එහි පිළිතුර "ඔව්" වශයෙන් සඳහන් විය යුතුය. ඒ අනුව අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන නොතිබුණි.
18	තොරතුරු දැන ගැනීමේ පනතට අනුව තම ආයතනයේ තොරතුරු ලබාදීම සඳහා නිශ්චිත නිලධාරියෙකු පත් කර නොතිබුණි. තොරතුරු පනතට අදාළව තොරතුරු ලබාදීම/ලබා නොදීම සම්බන්ධ විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි. ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි.	තොරතුරු නිලධාරියෙකු පත් කර ඇත. ලේඛන පවත්වාගෙන යනු ලබයි.
19	හදුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි. හදුනාගත් තිරසර අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	අරමුණ හා සම්බන්ධ ඉලක්කය වශයෙන් " 1.4 විශේෂයෙන් දරිද්‍රතාවයෙන් පෙලෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියළුම පුද්ගලයින්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්,මූලික සේවාවන් ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපළ උරුමයන්,ස්වභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මුල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශ වීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීමද එහි දර්ශකය වශයෙන් 1.4.2 ස්ත්‍රී පුරුෂ හිමිකම් මාදිලියට අනුව, නීත්‍යානුකූලව පිළිගත් ලිපි ලේඛන හා සුරක්ෂිත ඉඩම් හිමිකම් සහිත මුළු වැඩිහිටි ජනගහණය " ද දෙපාර්තමේන්තුවට සම්බන්ධ වේ. ඉහත අරමුණට අදාළව 2030 වර්ෂය දක්වා කාලය තුළ මෙම දෙපාර්තමේන්තුව විසින් ඉටුකර ගැනීමට අපේක්ෂිත ඉලක්කය වන්නේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මැනුම් කරනු ලබන කැඩැස්තර සිතියම් ප්‍රමාණය මත ඉඩම් අයිතිය තහවුරු කර නියම උරුම කරුවන් හට හිමිකම් ප්‍රකාශ කිරීම සඳහා රජයේ පූර්ණ වගකීම යටතේ හිමිකම් සහතිකයක් ලබා දීම වේ.
20	පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය සකස් කර ඇත.
21	ආයතනයේ පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	අධීක්ෂණය හා ඇගයීම සඳහා මේ වන විට ක්‍රමවේදයන් සකස් කර ඇත.

22	අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි	මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කර ඇත.
23	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් 50% කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	පුහුණු සැලැස්මද සකස් කර ඉහත සඳහන් මානව සම්පත් සංවර්ධන සැලැස්මට ඇතුලත් කර ඇත. ක්ෂේත්‍ර නිලධාරි සහ කාර්යාලගත නිලධාරින් සඳහා සැලසුම් කළ පරිදි ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවති.
24	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	2021 වර්ෂයට සකස් කර නොතිබුණ නමුත් 2023 වර්ෂයට සකස් කර ඇත.
25	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	නිලධාරියෙකු නම් කර රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇත.
26	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	සකස් කර ඇති පුහුණු සැලැස්මට අනුව ලැබෙන ප්‍රතිපාදන හා නිදහස් කරන අක්මුදල් මත පුහුණු අවස්ථා ලබාදෙමින් පවති.
27	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අනිතකර මට්ටමේ විය.	ආයතනයේ විගණන මතය තත්වාගණනය කළ මතයක් වන අතර 2022 වර්ෂය සඳහා සත්‍ය හා සාධාරණ මතයක් ලැබී ඇත.
28	සියලු නිලධාරින් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	වත්කම් බැරකම් ඉදිරිපත් නොකළ නිලධාරීන් ලිඛිතව දැනුවත් කර ඇත.
29	නිලධාරින්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ.156(1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි.	Evaluation Form Marks 2021 ප්‍රශ්නාවලිය පිරවීමේදී එහි Part 02 ,11 හි Sub KPI Level 1 හි 02 සඳහා වැරදීමකින් "ඔව්" යන්න සම්පූර්ණ කර තිබුණි. නමුත් සත්‍ය වශයෙන්ම එහි පිළිතුර වනුයේ Sub KPI Level 2 හි 2.1 හි "ඔව්" යන්න වේ.ඒ අනුව එවැනි පාඩුවක් සිදු වී නොමැත.
30	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරින් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	2023/05/02 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් අනුමත කරන ලද සංවර්ධන නිලධාරි,හිමිකම් විමර්ශණ නිලධාරි සඳහා වන අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රමවේදය අනුව 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලැබේ.

හරින්ද්‍ර නානායක්කාර (පා.ම.)
සංචාරක හා ඉඩම් අමාත්‍ය

ස්ථාවර නියෝග 112 (4)ප්‍රකාරව රජයේ මූල්‍යමය කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගන්නා ලද ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු සැසි අංකය : 290

දෙපාර්තමේන්තුවේ නම - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

මූල්‍ය හා කාර්ය සාධන ඇගයීම් වාර්තාවේ හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
1. සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු. රෙ. 103, 104, 109, හා 110 ප්‍රකාරව නිසි කටයුතු කරනොනිබුණි.	PJ 6947 හාPJ 6948 අංක දරන වාහන 02 සඳහා අයිතිය මෙම දෙපාර්තමේන්තුව වෙත පවතින නමුත් මෙම වාහන 02 මූල්‍ය කල්බදු යටතේ මිලදී ගෙන ඇති අතර එම වාරික ගෙවා අවසාන වන තෙක් පරම අයිතිය ලංකා බැංකුව සතු වන අතර ගෙවීම අවසන් වූ පසු මෙම දෙපාර්තමේන්තුව නමින් පවරා ගත යුතුය. එමෙන්ම PK 7040 සහPK7050 රථ දෙක භාණ්ඩාගාරය භරහා මූල්‍ය කල් බදු ක්‍රමය යටතේ මිල දී ගෙන ඇත. එම වාරික ගෙවා අවසන් වූ පසුව අයිතිය මෙම දෙපාර්තමේන්තුව නමින් පවරා ගත හැක. ඒ අනුව මෙම දෙපාර්තමේන්තුව සතු අනෙකුත් වාහන සියල්ලම (28 ක්) දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නමින් පවරාගෙන අවසන් කර ඇත. 2020 වර්ෂයේ උද්ගත වූ කොවිඩ් වසංගතය හා ඉන්පසු ඇති වූ ආර්ථික අර්බුදයක් ඉන්ධන භීතියක් මත රාජ්‍ය අංශයේ නිවාඩු ලබාදීම, නිලධාරීන්ගේ ගමනා ගමනයට බාධා ඇති වීමත් නිසා නිලධාරීන් වක්‍රීය ක්‍රමයට සේවයට ගෙන්වීම හේතුවෙන් මු. රෙ. 103, 104, 109 පරීක්ෂණ පැවැත්වීම හා එම කටයුතු අවසන් කිරීම සඳහා වන ක්‍රියාවලියේ තරමක ප්‍රමාදයක් සිදු වූ අතර මේ වන විට එම කටයුතු අවසන් කර ඇති බව කාරුණිකව දන්වමි.

හරීන් ප්‍රනාන්දු (පා.ම.)
සංචාරක හා ඉඩම් අමාත්‍ය

ස්ථාවර නියෝගඅංක 119(4) ප්‍රකාරව රජයේගිණුම් කාරකසභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගන්නා ලද ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම පාර්ලිමේන්තු සැසි අංකය : 290 ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව	
මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය සහ කාර්ය සාධන ඇගයුමෙහි හඳුනාගත් අඩුලුහුඩුකම්	එම අඩුලුහුඩුකම්/වර්තමාන තත්ත්වය නිවැරදි කිරීම සඳහා ගෙන ඇති පියවර
පළමු කොටස : 79.00	
01 .මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගනුදෙනුවක්ම අවම තරමින් නිලධාරීන් දෙදෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා නොතිබුණි.	මූල්‍ය බලතල පැවරීමේ ලිපිය අනුව සෑම අවස්ථාවකදීම අවම වශයෙන් තුන් දෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන ආකාරයට එය සිදු කර ඇත. බලය දීම හා අනුමත කිරීම එකම තනතුර සහිතව නොවැලැක්විය හැකි අවස්ථාවල ලබා දී තිබුනද බලය දෙන නිලධාරියා විසින් වවුවර් අනුමත කිරීම කිසිදු අවස්ථාවක සිදුවී නැත.
02. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	සෑම විගණන විමසුමකටම පිළිතුරු සැපයීම එසේ ප්‍රමාද වී නොමැති නමුත් ප්‍රාදේඔෟය කාර්යාල විගණනයේදී අතිරේක සර්වේයර් ජනරාල් (ක්ෂේත්‍ර) මගින් පළාත් සර්වේයර් ජනරාල් මගින් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී මගින් ප්‍රාෙදේශිය කාර්යාල වලින් පිළිතුරු ගෙන්වා ගැනීමේදී යම් යම් ප්‍රමාදයන් ඇතිවේ.
03. අභ්‍යන්තර විගණන විමසුම සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	1. සෑම අභ්‍යන්තර විගණන විමසුමකටම පිළිතුරු සැපයීමට මාසයකට වඩා වැඩි කාලයක් ගෙන නැතත් ප්‍රාදේශීය කාර්යාලවල විගණන විමසුම් ඉදිරිපත් කිරීම අතිරේක සර්වේයර් ජනරාල්(ක්ෂේත්‍ර) මගින්, පළාත් සර්වේයර් ජනරාල් මගින්, දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී මගින්, මිනින්දෝරු අධිකාරී වෙත යවා නැවත එම අනුපිළිවෙලට පිළිතුරු ගෙන්වා ගැනීම නිසා යම් ප්‍රමාදයක් සිදුවී ඇත.
04. සියලු වාහනවල අයිතිය තහවුරු ලිපි සන්තකයේ නොමැත.	1. දෙපාර්තමේන්තුවසතුව මේ වන විට වාහන 318 ක ප්‍රමාණයක් පවතින අතර ඉන් එක් වාහනයක හැර අනෙකුත් සියළුම වාහන වල අයිතිය තහවුරු කරනු ලබන ලියවිලි මේ වන විට දෙපාර්තමේන්තුව සතුව පවතින බව කාරුණිකව දන්වමි. එමෙන්ම දැනට අයිතිය තහවුරු කිරීමේ ලියවිලි නොමැති අංක 32-6741 දරණ වාහනයෙහි එන්ජීන් අංකය සහ චැසි අංකය මැකී ගොස් ඇති අතර එම අංකය තහවුරු කර ලියාපදිංචි අයිතිය අප වෙත පවරා ගැනීමට අවශ්‍ය ලියවිලි මේ වන විට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව ද කාරුණිකව දන්වමි. (ඇමුණුම 01)
05. සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	1. දැනට මෙම දෙපාර්තමේන්තුවෙහි ඇති වාහන සියල්ලෙහිම රාජ්‍ය ලාංඡනය සහ දෙපාර්තමේන්තු නිල නාමය හාෂා ත්‍රිත්වයෙන්ම මුද්‍රණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. ඒ සඳහා නිසි ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පවතින බවද කාරුණිකව දැනුම් දෙමි.
06. වාහනයක් ගර්හිත වී මාස 8	වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයකදී අපහරණය කළ යුතු බවට

කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	කාලසීමාවක් සටහන් කර ඇති නමුත්, පියවර කිහිපයක් යටතේ කටයුතු කිරීමේදී (සමීක්ෂණ මණ්ඩල/තක්සේරු මණ්ඩල පත්කිරීම, අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීම,වාහනවල ලියාපදිංචිය අවලංගු කිරීම, ලංසු කැඳවීම වැනි කරුණු අනුව) අදාළ මණ්ඩලවල තීරණ ලබා ගැනීමට සැලකිය යුතු කාලයක් ගත වන බැවින් මෙසේ නියමිත කාලසීමාවන් තුළදීම ආළ කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත් මේ වනවිට අදාළ වාහන සියල්ල වෙන්දේසි කර අවසන් කර ඇත.
07. කාර්ය මණ්ඩලයේ සියළු දෙනා වෙත ලිඛිත කාර්ය පැවරුම් කර නොතිබුණි.	මේ වන විට කාර්ය මණ්ඩලයේ සියලුමදෙනා වෙත ලිඛිත කාර්යන් පැවරීම සිදු කර ඇත.
දෙවැනි කොටස 92.00 08.සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	මේ සඳහා නිසි මානව සංවර්ධන සැලැස්මක් සකස් කර ලබා දෙනු ලබන ප්‍රතිපාදන සීමාව තුළ උපරිම නිලධාරීන් පිරිසකට පුහුණු අවස්ථා ලබාදීමට ඉදිරියේදී කටයුතු කරමි.
09. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවතා මට්ටමේ හෝ අභිතකර මට්ටමේ විය.	දෙපාර්තමේන්තුව තුළ තිබූ විවිධ දුර්වලතා හා අඩුපාඩු නිසා අවසාන ගිණුම් තුලින්ද ඒවා හෙළිදරව් වන බැවින් මතය ව්‍යවනය වී තිබුනද 2022 වර්ෂයේදී එම අඩුපාඩු නිවැරදි කරගෙන සත්‍ය හා සාධාරණ මතයක් ලබා ගැනීමට කටයුතු කර ඇත.

හරින් ප්‍රනාන්දු (පා.ම.)
සංචාරක හා ඉඩම් අමාත්‍ය